# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2392/45 – 2024 ජූලි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2024.07.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2023/83.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

කේ. ජී. ඒ. ගුණසේකර මයා, අංක 372, ගාලු පාර, නල්ලූරුව, පානදුර.

සහ

ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 36, කර්මාන්තපුරය, මෝදරවිල, පානදුර.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, බුද්ධාලෝක පාර අංක 40, ආචාර්ය කේ. ඒ. තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජූලි මස 02 වැනි දින,
කොළඹ දී ය.

1A – G 42212 – 09 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2023/83.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ජී. ඒ. ගුණසේකර මයා, අංක 372, ගාලු පාර, නල්ලූරුව, පානදුර.

සහ

ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 36, කර්මාන්තපුරය, මෝදරවිල, පානදුර.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ

"ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ආයතනයේ සේවය කරමින් සිටියදී 2020.05.12 දින සිට වැඩ තහනම් කරනු ලැබූ කේ. ජී. ඒ. ගුණසේකර මහතා 2020.07.21 දින සිට නැවත සේවයෙහි පිහිටුවීමේ දී වැඩ තහනම් කර තිබූ කාල සීමාව සඳහා වැටුප් නොගෙවීම සහ දැරූ තනතුරට අදාළ රාජකාරි නොදීම මඟින් අසාධාරණක් සිදුව තිබේ ද යන්නත් අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ. "

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 04 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ,
කාර්යාලයේදී දින යොදන ලදි.

EOG 07 - 0103